# අබා

පඬුඅබා රජු යනු සිංහල ඉතිහාසයේ අනන්‍ය රජ කෙනෙකි. සිංහල ජාතිය ගොඩනැගීමේ ගෞරවය හිමිවන්නේ එතුමාට ය. යුරෝපයේ ජාතික රාජ්‍ය ගොඩනැගීමට අවුරුදු දෙදහසකට පමණ පෙර එතුමා මෙරට එක්සේසත් රාජ්‍යයක් ගොඩනැගුවේ වැදි ගෝත්‍රය හැරෙන්නට මෙරට එවකට සිටි අන් ගෝත්‍ර ජාතියක් ලෙස එක්කරමිනි. එවැනි රජකුගේ කුමාර කාලය අරභයා නිපදවෙන චිත්‍රපටියක් සිංහලයන්ට ඉතා වැදගත්වන බව අමුතුවෙන් කිවයුතු නො වේ. මා සිතන අයුරින් සිංහල චිත්‍රපට ඉතිහාසයේ නොවූ අයුරින් චිත්‍රපටියේ මංගල ප්‍රදර්ශනයේ දී පළමු දින කවරයක් නිකුත් කිරීමට ද ආණ්ඩුව පියවර ගෙන තිබුණි. අබා චිත්‍රපටියෙන් කියන්නේ කුමක් ද යන්න ඇතැමුන්ට ප්‍රශ්නයක් නොවිය හැකි ය. පඬුඅබා වීර කාව්‍යය චිත්‍රපටියට නැගීමක් ලෙස ඇතැමුන් ඒ දකිනු ඇත. තවත් අයට ඒ දේශප්‍රේමය සමග මුසු වූවකි. එහෙත් සියළු දෙනාට ම ඒ එසේ නො පෙනෙයි. පඬුඅබා අවසානයේ දී සතුරන් නසන තෙක් දිගට ම යුද වදිමි ආදී ලෙස කරන ප්‍රකාශය පිළිබඳ ව මහාචාර්යවරයකුව සිට විශ්‍රාම ගිය ප්‍රසිද්ධ පුද්ගලයකු පඬියකු මෙන් ඇසුවේ මාමාවරුන් මරා රජවීම මොන දේශප්‍රේමයක් ද කියා ය. ඔහු පඬුඅබා චරිතය පිළිබඳ ව දන්නා දේ ඉතා අල්ප බව ඔහු චිත්‍රපටිය පටන්ගැනීමට පෙර ඇසූ ප්‍රශ්නවලින් ද පැහැදිළි ය. අද අපට ජාතිය ගොඩනැගීම ගැන කරුණු කියා දෙන්නේ තවමත් දහනවවැනි සියවසේ යුරෝපයේ ජීවත්වන මෙවැනි පුද්ගලයන් වීම කණගාටුදායක ය.

අබා චිත්‍රපටියට මුදල් කන්දරාවක් වියදම් කර ඇත. එහි බටහිර චිත්‍රපටියක මෙන් තාක්ෂණය යොදාගෙන ඇත. එපමණක් නොව චිත්‍රපටිය නිපදවා ඇත්තේ ද බටහිර වෙළෙඳපොළ ද ඉලක්ක කරමිනි. අබා චිත්‍රපටිය එක් අතෙකින් චෙල්වනායගම්ගේ ලංකා රාජ්‍ය පක්ෂය මෙනි. ඒ වෙනම රාජ්‍යයක් සඳහා සටන්කළ අවිහිංසාවට මුවාවී දෙමළ ජනයා හිංසාවට පෙළඹවූ දේශපාලන පක්ෂයක් විය. එහෙත් සිංහලයන්ට පෙන්නුම් කෙළේ ඒකීය සන්ධීය හෙවත් ෆෙඩරල් රාජ්‍යයක් වෙනුවෙන් සාමකාමීව කටයුතු කරන පක්ෂයක් ලෙස ය. එහෙත් චෙල්වනායගම්ට සිංහල ජනයා රැවටීමට නො හැකිවිය. අබා චිත්‍රපටියෙහි රඟපාන්නෝ නළු නිළියෝ පමණක් ම නො වෙති. චිත්‍රපටිය ද රඟපෑමක යෙදෙයි. අබා සිංහලයන්ට පෙන්වීමට උත්සාහ කරන්නේ අවුරුදු දහසයක් වන තුරු පඬුඅබාගේ කුමාර කාලය ය. එහෙත් එහි ඇත්තේ පඬුඅබාගේ පියාගේ කතාව ය. බටහිරට තේරුම් යනු ඇත්තේ මේ පියාගේ කතාව මිස පඬුඅබාගේ කතාව නො වේ. පඬුඅබා අබාවූයේ කෙසේ ද? වංසකතාවට අනුව පඬුඅබා එලෙස නම්කෙරුණේ කුමරාගේ මුත්තණුවන් වූ පණ්ඩුවාසදේව රජුගේ හා ලොකුමාමා වූ අභය කුමරාගේ නමිනි. කුමරා පණ්ඩු හෝ අභය හෝ නො වීය. ඔහු පණ්ඩුකාභය හෙවත් පඬුඅබා විය. චිත්‍රපටියේ පඬුඅබා අබා වූයේ ඇයි?

වංසකතා සැම කරුණක් සම්බන්ධයෙන් ම එකඟ නොවන බව පැහැදිළි ය. දීපවංසයට, මහාවංසයට පමණක් නොව මහාවංස අටුවාවට ද අනුව පඬුඅබාගේ පියා දීඝගාමිණී කුමරු ය. ඔහු භද්දකච්චනා කුමරියගේ සහෝදරයෙක් විය. විඩූඩභ කුමරු ශාක්‍යයන් ඝාතනය කිරීම හේතුකොටගෙන ශාක්‍ය දේශයෙන් දඹදිව දකුණට පැන ආ ශාක්‍ය පවුලක කුමාරිකාවක් වූ භද්දකච්චනා කුමරිය එතැනින් ලංකාවට පැමිණ ඇත්තේ පරිබ්‍රාජිකාවක ලෙස වෙස්වළා ගනිමිනි. පඬුවස්දෙව් රජු ඇය සිය මෙහෙසිය කරගත්තා ය. පඬුඅබාගේ මව වූ චිත්‍රා කුමරිය ඔවුන් දෙපොළගේ දියණිය වූවා ය. චිත්‍රාවගේ පුතකු මාමාවරුන් මරා රජකම ගන්නා බව අර්ධ වෛදික (දඹදිවෙන් මෙරටට පැමිණියෝ නැගෙනහිර දේශයේ වැසියෝ වූහ. ඔවුහු මුළුමනින් ම වෛදිකයෝ නොවූහ) බමුණෝ කීහ. චිත්‍රාවගේ සොහොයුරෝ ඇය එක්ටැම් ගෙයක සිරකළහ. එහෙත් වංසකතාවලට අනුව ඇය දීඝගාමිණී කුමරු නිසා ගැබ්ගත්තා ය.

රජගෙදර චිත්තරාජ හා කාළවේල නමින් යක්ෂ ගෝත්‍රයට අයත් සේවකයෝ දෙදෙනෙක් වූහ. චිත්‍රා කුමරියට පුතකු ලැබුණු නමුත් භද්දකච්චනා දේවිය උපායශීලීව කටයුතු කර සේවිකාවක ප්‍රසූත කළ දියණියක සමග පුතා මාරුකර කුමරිය දියණියක ප්‍රසූත කළ බව ප්‍රචාරය කළා ය. පුත් කුමරා, එනම් පඬු අබා දොරමඬලාවට පිටත්කර යැවිණි. එහි දී ඔහු යක්ෂ ගෝත්‍රිකයන් ඇසුරේ වැඩුණේ ය. පඬුඅබා යක්ෂ ගෝත්‍රිකයන් අතරට යවන්නට ඇත්තේ ඔහුට අර්ධ වෛදිකයන් අතර ආරක්ෂාව මඳ වූ බැවින් විය යුතු ය. කෙසේ වෙතත් චිත්‍රාව දීඝගාමිණී කුමරුට ම සරණ පාවා දෙනු ලැබිණි. දිපවංසය හා මහාවංසය අතර වෙනසක් දකින්නට ලැබෙන්නේ චිත්තරාජ හා කාළවේල සම්බන්ධයෙනි. දීපවංසයට අනුව ඔවුහු මරාදමනු නො ලැබෙති. එහෙත් මහාවංසයට අනුව චිත්‍රා කුමරියට නිසි ලෙස රැකවල් නොදීම හේතුවෙන් ඔවුහු මරාදමනු ලැබූහ. වංසකතාවෙහි සඳහන් නොවුවත් අබා චිත්‍රපටියෙහි චිත්තරාජ පඬුඅබාගේ පියා

© Prof. Nalin De Silva

වෙයි. දීපවංසයෙහි සඳහන් නොමැති සිද්ධියක් ඉන් අවුරුදු සියයකට පමණ පසුව ලියූ මහාවංසයෙහි ඇතුළත් වන්නේ ඒ කාල පරිච්ඡේදයෙහි එකතු වූ ජනප්‍රවාද අනුව විය හැකි ය. ඒ කෙසේ වෙතත් මහාවංසය කියන්නේ චිත්තරාජ මරණයෙන් පසුව යක්ෂ යෝනියෙහි ඉපදී පඬුඅබා කුමරුට ආරක්ෂාව දුන් බව ය. අබා චිත්‍රපටිය මහාවංසයට ද එහා ගොස් පඬුඅබා චිත්තරාජගේ ලේ ධාතුව බව කියයි.  අබා චිත්‍රපටියෙහි ප්‍රධාන තේමාව වන්නේ ද චිත්තරාජ පියා පඬුඅබා පුතු ආරක්ෂා කිරීම ය.

යුදෙව් ගෝත්‍රයෙහි උපන් ක්‍රිස්තුස් වහන්සේ කතාකළේ ඇරමික් බස ය. යුදෙව්වන්ගේ (ප්‍රධාන) බස වූයේ හීබෲ බස ය. හීබෲ බසින් පියාට කියන්නේ ආබ් කියා ය. ඇරමික් බසින් ඒ අබ්බා (අබා) වෙයි. පඬුඅබාගේ අබා (පියා) චිත්තරාජ වෙයි. චිත්‍රපටියෙහි එතරම් රඟපෑමක් නොලැබුණත් ප්‍රධාන චරිතය වන්නේ පුතු ආරක්ෂාකරන පියාගේ (අබා) ආත්මය ය. පඬුඅබා අබා බවට ලුහුවන්නේ අර්ථයක් නැතිව නො වෙයි. ශාක්‍ය වාංශික භද්දකච්චනා කුමරිය බෞද්ධ වූවාදැයි අපි නො දනිමු. පඬුඅබා නම් බොහෝ විට බෞද්ධ නොවන්නට ඇත. එහෙත් එතුමා යුදෙව් ආගමිකයකු හෝ කිතුණුවකු හෝ නො වීය. එතුමා උපන්නේ ක්‍රිස්තුත්වහන්සේ ඉපදීමට පෙර ය. කෙසේ වෙතත් අබා චිත්‍රපටියෙහි සංකේත බොහෝමයක් යුදෙවු ක්‍රිස්තියානි වෙයි. චිත්තරාජ හා කාළවේල මරණයට පත්කරන දර්ශනය සිහිගන්වන්නේ ක්‍රිස්තුස් වහන්සේ ඇණගැසීමට ගෙන ගිය අන්දම ය. චිත්තරාජ මරණයට යන්නේ කුරුසයකට බැඳ ඒ කරතබාගෙන යන අයුරුනි. පඬුඅබා පියා (අබා) විසින් රැකෙන්නේ ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ විසින් රැකගත් ආකාරයට ය. ලේ ධාතුව පිළිබඳ කතාව ද පරණ තෙස්තමේන්තුවේ පීතෘ පුත්‍ර සම්බන්ධය සිහිගන්වයි. නළු නිළියන්ගේ ඇඳුම් පිළිබඳ ව ද ප්‍රශ්න වෙයි. දොරමඬලාවේ ස්ත්‍රීන් ඇඳ සිටි ඇඳුම බටහිර ආසියාවේ ඇඳුමක හැඩය ගනියි. එකල මාතෘමූලික සමාජයක් වී යැයි මම නො සිතමි. මෙකල පීතෘ මූලික සමාජ තිබූ පමණින් සැමදා එක්කෝ මාතෘ මූලික හෝ පීතෘ මූලික හෝ සමාජ තිබිණි යැයි කිවහැකි නොවේ. යක්ෂ සමාජය ඒ දෙකෙන් එකක්වත් නොවන්නට ඇත. චිත්තරාජ යක්ෂ යෝනියෙහි උපන් පසු ප්‍රේක්ෂකයා ඉදිරියට එන්නේ ද යුදෙව් ක්‍රිස්තියානි දේව ඇඳුමිනි. එපමණක් නො වේ. පණ්ඩුල බ්‍රාහ්මණයා ද අපට සිහිගන්වන්නේ අර්ධ වෛදික හෝ යක්ෂ හෝ සංස්කෘතියක් නොව යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියකි. පණ්ඩුල බමුණා යනු යක්ෂයන්ට අනුකම්පා කළ බ්‍රාහ්මණයකු ද නැත්නම් යක්ෂයන්ගේ පූජකයකු දැයි අපි නොදනිමු. වංශකතා විසින් සමහරවිට යක්ෂ පූජකයකු බ්‍රාහ්මණයකු ලෙස හඳුන්වනු ලබන්නට ඇත. වංසකතාවල යක්ෂ ගෝත්‍රිකයන්ට එතරම් තැනක් නො ලැබෙයි. ඒ තේරුම්ගත හැකි ය. (විදුසර ලිපිවල මේ විස්තර කෙරෙයි) එහෙත් අබා චිත්‍රපටිය යුදෙව් ක්‍රිස්තියානි පසුබිමක නිර්මාණය වී ඇත්තේ ඇයි?

පඬුවස් දෙව් රජුගේ රජගෙය ද සංකීර්ණ ය. එහි යක්ෂයන් ද සේවය කර ඇත. ඒ මහා බළකොටුවක් වී යැයි සිතිය නො හැකි ය. දැවැන්ත චිත්‍රපටියක් නිර්මාණය කිරීම සඳහා අප සරල සංස්කෘතියෙහි නොතිබූ අංග රාශියක් ආටෝප සාටෝප සහිතව ඉදිරිපත් කෙරී ඇත. අබා නරඹද්දී යමකුට බෙන්හර් චිත්‍රපටි ආකෘතිය සිහිවේ නම් ඒ පුදුමයට කරුණක් නො වේ. අනෙක් අතට යක්ෂ ගම්මාන නිරූපණය වන්නේ තැන තැන කුඩු වැනි ගෙවල් තැනූ බිමක් ලෙස ය. චිත්‍රපටියෙහි කීව ද දොරමඬලාවේ යක්ෂයන් කිසි දා අර්ධ වෛදික ශ්ලෝක නොකියන්නට ඇත. මේ සියල්ලටම වඩා පඬුඅබා කෙළේ කුමක් ද යන්න පිළිබඳ ව හැඟීමක් අපට චිත්‍රපටියෙන් නො ලැබෙයි. චිත්‍රපටියෙහි ඔහු සතුරන් නැසීමක් ගැන කියයි. පඬුඅබාගේ පියා චිත්තරාජ වුව ද දීඝගාමිණී වුව ද කුමරා හැදුනේ වැඩුනේ යක්ෂ ගෝත්‍රිකයන් අතර ය. පඬුඅබා රජු අවසානයේ දී කෙළේ කුමක් ද? එතුමා සිංහ වාංශිකයන් සියළු දෙනා ඝාතනය නොකළ බව පැහැදිළි ය. එතුමා තැනූ ජාතිය සිංහල වූයේ සිංහ වාංශිකයන් නමිනි. සිංහල යන්නෙහි ල ප්‍රත්‍යය එකතු වී ඇත්තේ ගෞරවාර්ථයකින්දැයි සොයා බැලිය යුතු ය. ජාතිය සිංහ වාංශිකයන් නමින් නම් කෙරුණ ද ඒ තැනූ සිංහල ජාතියෙහි සංස්කෘතිය ප්‍රධාන වශයෙන් ම යක්ෂ විය. ගොවිතැන් කළෝ ඔවුහු ය. වංසකතාවලට අනුව උත්සව අවස්ථාවන්හි දී පඬුඅබා රජු චිත්තරාජට සම අසුන් දුන්නේ ය. ඔහු මියගියේ නම් සෑම අයකුට ම පෙනෙන පරිදි අසුන් පැනවූයේ කෙසේ ද?  සිංහල ජාතියෙහි චින්තනය නාග දේව ආදී ගෝතිකයන්ගේ කලාපීය පූර්ව වෛදික චින්තනය විය. පඬුඅබා ම මේ සියල්ලෙහි මිශ්‍රණයක් විය. කුමරුගේ පියා කවරකු වුව ද මව අර්ධ වෛදික සිංහ වංශයට මෙන් ම පූර්ව වෛදික ශාක්‍ය වංශයට ද අයත් විය. කුමරා හැදුණේ වැඩුණේ යක්ෂ සංස්කෘතියක ය. පඬුඅබා රජු වැදි ගෝත්‍රය හැර සියළු ගෝත්‍ර එක්කළා මිස එක් ගෝත්‍රයක් හෝ වනසා නො දැමී ය. එතුමා මාමාවරුන්ගේ සේසත් ගෙන්වා එක්සේසත් රාජ්‍යය ද බිහිකෙළේ ය. අද ද අප ආදර්ශයට ගත යුත්තේ පඬුඅබා මිස බටහිරයන් නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva